// ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,119 — 1960 අප්‍රේල් 29 වැනි සිකුරාදා — 29.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

# III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටුඅංක යොදා ඇත)

| | පිට |
|---|---|
| **ඉඩම් නිරවුල්කිරීම පිළිබඳ දැන්වීම් :—** | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | 195 |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 196 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | 203 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |

## ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම

### ඌව පළාත

ඉලක්කම.—14,598 ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරිතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1960 ජූනි මස 7 වෙනි දින වූ අඟහරුවාද පෙරවරු 9ට පාලුගම, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ සැයි බන්ගලාවේදී විකිණීමට නොහොත් වෙන අන්දමකින් තීන්දු කරන්ට යෙදෙනවා ඇත.

ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ උඩ පලාත කෝරලේ පිහිටා තිබෙන බිම් කැබලි දෙකක්.

| බිම් කැබෙල්ලේ නොම්මරය | ඉඩමේ නම | අයිතිකම කියාහිටින අයගේ නම | කොයි අන්දමේ ඉඩමක්ද යන වග | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|---|---|
| | | ලංකා මැණිමේ ගම් සිතියමේ අංකය 513—හෙවනෙකුඹුර | | |
| 77 | දමුණුගහ ආරාවෙවත්ත ... | හෙවනෙකුඹුරේ පදිංචි හෙවනෙකුඹුරෙගෙදර රත්නායක මුදියන්සේලාගේ කිරිබණ්ඩා | තේ ... | 0 0 31 |
| 450 | දමුණුගහආරාවෙවත්ත ... | හෙවනෙකුඹුරේ පදිංචි පිටහකුඹුරෙගෙදර නිශ්ශංක මුදියන්සේලාගේ පුංචිරාල, හෙවනෙකුඹුරේ පදිංචි පිටහකුඹුරෙගෙදර නිශ්ශංක මුදියන්සේලාගේ උක්කු බණ්ඩා, හෙවෙනකුඹුරේ පදිංචි දියකඩෙගෙදර හිටිහාමි මුදියන්සේලාගේ පුදු මැණිකා, හෙවනෙකුඹුරේ පදිංචි දියකඩෙගෙදර හිටිහාමි මුදියන්සේලාගේ බණ්ඩාරමැණිකා. | හේන | 0 1 04 |

තක්සේරු මිල : අක්කරයක් රුපියල් 100කට වැඩි නොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරිතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකි වේ.

1960 මාර්තු 28 වෙනි දින,
ඉඩම් පිළිබඳ කොමසාරිස් තුමාගේ කාර්යාලයේ දිය.

ටී. කේ. ආර්. අසරප්පා,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට.

195—ජේ. ඇන්. බී 23572—1,944 (4/60)

# ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටල්ලාගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙසින් ප්‍රකාශ කරමි:

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර ආදායම් කොට්ඨාශයේ දන්තුරේ ගම්මුලාදැනි කොට්ඨාශයේ දන්තුරේ ගමෙහි පිහිටි පන්සලේවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අඩි 35 ක් දිගින්ද අඩි 25ක් පලලින්ද පහත මායිම් සඳහන් ඉඩම :—

උතුරට: ඇඹිල්මීගම-අලගල්ල ප්‍රසිද්ධ පාර; නැගෙනහිරට: ඇම්. එච්. අබරන් අප්පු අයිතිවාසිකම් කියන හල්ගහමුලවත්ත; දකුණට: ඒ අබ්දුල් මජීඩ් අයිතිවාසිකම් කියන ගලෙන්දන්බ කුඹුර නැමැති කුඹුර; බස්නාහිරට: එම ඉඩමේ ඉතිරි කොටස.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

ඇල්. ඩී./ඩී. 52—ජේ 59/60 ඇල්.ජී 52.

1960 ක්වූ මාර්තු මස 31 වැනි දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මේහි පහතා විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටල්ලාගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙසින් ප්‍රකාශ කරමි:

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර ආදායම් කොට්ඨාශයේ වලගෙදර ගම්මුලාදෑනි කොට්ඨාශයේ මත්ගමුව ගමෙහි පිහිටි මර්කන්ටයිල් වත්තෙන් ප්‍රමාණයෙන් අක්කර 1ක් පමණ වූ මරකටලාව නමැති ඉඩම් කැබැල්ලට මායිම්:—

උතුරට: ජී. ජිනදාස මහතා අයිතිවාසිකම් කියනු ලබන බොරපැන් පිහිල්ලේවත්ත නමැති තේ ඉඩම සහ උඩුවිහාරේ කරත්ත පාර; නැගෙනහිරට: උඩුවිහාරය අයිතිවාසිකම් කියන උඩතැන්නේ වත්ත සහ ගම්සභා පාර; දකුණට: මල්ලන්දූ අයිතිවාසිකම් කියන අලුකුඹුරගේන නොහොත් වත්ත; බස්නාහිරට: මර්කන් ටයිල් වත්තේ ඉතිරි කොටස.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

අංකය: ඇල්. ඩී/ඩී 49—ජේ 59/60 ඇල් ජී 41.

1960 ක්වූ මාර්තු මස 29 වැනි දින,
කොළඹදීය.

---

අංකය: 3/41/82.

## 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරන ඉඩම් අත්කරගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය මොහොට්ටාල්ලගේ ඩිංගිරි බන්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙසින් ප්‍රකාශ කරමි:—

මාතලේ දිස්ත්‍රික්කයේ උතුරු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පාදෙණිය ගම්මුලාදැනි කොටසේ රත්මලගහ-ඇල ගමේ නාරන්ගහමූලයාය නැමැති ඉඩමෙන් අක්කර 2ක පමණ බිම් ප්‍රමාණය සහ ඊට මායිම්:—

උතුරට සහ නැගෙනහිරට: ඩී. ගුණරතන ස්ථවිර සහ තවත් අය අයිතිකම් කියන නාරන්ගහමූලයාය නැමැති ඉඩම; දකුණට: ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාර; බස්නාහිරට: වී. එච්. හේරත්හාමි අයිතිකම් කියන නාරන්ගහමූලයාය නැමැති ඉඩම.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම සහ ඉඩම් පිළිබඳ ඇමති.

සඳහන් අංකය: ජේ 58-59 ඊ 840.

1960 මාර්තු මස 31 දින
කොළඹදීය.

---

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කරගැනීමේ ආඥාපනත

### 5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950යේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ විජයානන්ද දහනායක නමැති මම මෙසින් ප්‍රකාශ කරමි:

ගාළු දිස්ත්‍රික්කයේ කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ගාළු නාගරික සභා සීමාව තුළ මඩපාතල නමැති ගමේ නගර කොට්ඨාශ අංක 8වේ ස්ටිල් පාරේ වරිපනම් අංක 51න් හැඳින්වෙන (ඒ. 952 දරණ මූලික සිතියමේ අංක 36 දරණ කැබැල්ලෙන් කොටසක්) මිදෙල්ලගහවත්ත නොහොත් තුවන්ගෙවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 00.4ක් පමණවූ, පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් කොටසක්.

උතුරට: දැනට ඇති අඩිපාර; නැගෙනහිරට: දැනට ඇති අඩිපාර; දකුණට සහ බස්නාහිරට: එම ඉඩමේ ඉතිරි කොටස.

2. ගාළු දිස්ත්‍රික්කයේ කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ගාළු නාගරික සභා සීමාව තුළ මඩපාතල නමැති ගමේ නගර කොට්ඨාශ අංක 8වේ ස්ටිල් පාරේ වරිපනම් අංක 34න් හැඳින්වෙන (ඒ. 952 දරණ මූලික සිතියමේ අංක 37 දරණ කැබැල්ලෙන් කොටසක්) මිදෙල්ලගහවත්ත නොහොත් තුවන්ගෙවත්ත නමැති ඉඩමෙන්, ප්‍රමාණයෙන් පර්චස් 00.2ක් පමණවූ, පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් කොටසක්.

උතුරට: දැනට ඇති අඩිපාර; නැගෙනහිරට: ස්ටිල් පාරේ වරිපනම් අංක 11හේ කොටසකින් හැඳින්වෙන, බඩහැලවත්ත නොහොත් බකිනිගහවත්ත නමැති ඉඩම (අංක ඒ. 952 දරණ මූලික සිතියමේ අංක 39 දරණ කැබැල්ලෙන් කොටසක්); දකුණට: එම ඉඩමේ ඉතිරි කොටස; බස්නාහිරට: දැනට ඇති අඩිපාර.

3. ගාළු දිස්ත්‍රික්කයේ කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ගාළු නාගරික සභා සීමාව තුළ මඩපාතල නමැති ගමේ නගර කොට්ඨාශ අංක 8වේ ස්ටිල් පාරේ වරිපනම් අංක 35න් හැඳින්වෙන (ඒ. 952 දරණ මූලික සිතියමේ අංක 38 දරණ කැබැල්ලෙන් කොටසක්) බකිනිගහවත්ත නමැති ඉඩමෙන්, ප්‍රමාණයෙන් පර්චස් 01.5ක් පමණවූ, පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් කොටසක්.

උතුරට: එම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: කාණුව (අංක ඒ. 952 දරණ මූලික සිතියමේ අංක 41 දරණ කැබැල්ල): දකුණට: දැනට ඇති අඩිපාර; බස්නාහිරට: අංක 2 දරණ මඩපාතල පටු මාවතේ වරිපනම් අංක 53නේ කොටසකින් හැඳින්වෙන මාදංවෙල නොහොත් අද්දරකුඹුර සහ දැනට ඇති අඩිපාර (අංක ඒ. 952 දරණ මූලික සිතියමේ අංක 34 දරණ කැබැල්ල).

4. ගාලු දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ගාලු නාගරික සභා සීමාව තුළ මඩපාතල නමැති ගමේ නගර කොට්ඨාශ අංක 8වේ, ස්ටිල් පාරේ, වරිපනම් අංක 11න් හැඳින්වෙන, (ඒ. 952 දරණ මූලික සිතියමේ අංක 29 දරණ කැබැල්ලෙන් කොටසක්) බඩහැලවත්ත නොහොත් බකිනිගහවත්ත නමැති ඉඩමෙන්, ප්‍රමාණයෙන් පර්චස් 01.00ක් පමණ වූ, පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් කොටසක්.

උතුරට: දැනට ඇති අඩිපාර; නැගෙනහිරට: ස්ටිල් පාර; දකුණට: එම ඉඩමේ ඉතිරි කොටස; බස්නාහිරට: එම ඉඩමේ ඉතිරි කොටස සහ ස්ටිල් පාරේ, වරිපනම් අංක 34රේ කොටසකින් හැඳින්වෙන මිදෙල්ලගහවත්ත නොහොත් තුවන්ගේවත්ත (ඒ. 952 දරණ මූලික සිතියමේ අංක 37 දරණ කැබැල්ලෙන් කොටසක්).

5. ගාලු දිස්ත්‍රික්කයේ කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ගාලු නාගරික සභා සීමාව තුළ මඩපාතල නමැති ගමේ නගර කොට්ඨාශ අංක 8 වේ, ස්ටීල් පාරේ, වරිපනම් අංක 15න් හැඳින්වෙන, (ඒ. 952 දරණ මූලික සිතියමේ අංක 40 දරණ කැබැල්ලෙන් කොටසක්) බඩහැලවත්ත නොහොත් බකිනිගහවත්ත නමැති ඉඩමෙන්, ප්‍රමාණයෙන් පර්චස් 00.3ක් පමණ වූ, පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් කොටසක්.

උතුරට: එම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: ස්ටීල් පාර; දකුණට: කාණුව (අංක ඒ. 952 දරණ මූලික සිතියමේ අංක 41 දරණ කැබැල්ල); බස්නාහිරට: කාණුව (අංක ඒ. 952 දරණ මූලික සිතියමේ අංක 41 දරණ කැබැල්ල).

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමති.

අංක ජේ 57/ඇල්ජී. 134/ඇල්ඒ/බී. 106.

1960ක් වූ ජනවාරි මස 20 වැනි දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම හා ඉඩම් ඇමති මොහොට්ටාල්ලගේ ඩින්ගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත, 1950යේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙවමැදි හත් පත්තුවේ හත්වැල්ල පළාතේ යන්තම්පොල නමැති ගමේ පිහිටි වැලිපිල්ලෑව නමැති ඉඩමෙන් පර්චස් 01.0 ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම්තුල පිහිටි බිම් කොටස:—

උතුරට සහ බස්නාහිරට: ආර්. ඇම්. පුංචි බණ්ඩා සහ තවත් අය හිමි කම් කියන වැලිපිල්ලෑව ගල; නැගෙනහිරට: සිමෙන්ති කැටය සහ බැම්මේ කොටසක්; දකුණට: සිමෙන්ති බැම්ම.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

සඳහන් අංකය: 3/61/25—ජේ 57/58 ඇල් 184.

1960 අප්‍රේල් මස 7 දින,
කොළඹදීය.

---

මගේ අංකය 3/62/67.

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කරගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කරගනු ලැබේයයි ද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය විජයානන්ද දහනායක වන මම, 1954 අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කරගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩඩ විල්ලි හත්පත්තුවේ කුරුණෑගල නාගරික සීමාව තුළ උතුරු නාගරික මුලාදෑනි කොට්ඨාශයේ පොල්අත්තපිටිය නැමැති අංක 5 දරණ නාගරික කොටසේ පිහිටි, කුරුණෑගල-දඹුල්ල ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාරේ වරිපනම් අංක 2 දරණ අංක 58 දරණ නාගරික මානක සැලැස්මේ නො. 14 දරණ ඉඩම් කැබැල්ලෙන් කොටසක් වන ප. 36.9 පමණ මෙහි පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් ප්‍රමාණය.

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටසද; නැගෙනහිරට: කච්චේරි පාර හා මෙම ඉඩමේ ඉතිරි කොටසද; දකුණට: කුරුණෑගල-දඹුල්ල ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාරද; බටහිරට: සී. ඇල්. ඒ. ද සිල්වා වෛද්‍ය නිලධාරිතැන හා වෙනත් අය විසින් අයිතිවාසිකම් කියන වරිපනම් අංක 4 හා 6 දරණ කුරුණෑගල-දඹුල්ල ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාරේ පිහිටි ඉඩම්ද වේ.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම සහ ඉඩම් පිළිබඳ ඇමති.

සඳහන් අංකය: ජේ 59/60 එච් 55.

1960 පෙබරවාරි මස 19 දින,
කොළඹදීය.

---

අංකය: කිව් ඒ 490.

## 1954රේ අඩක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අඩක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ, 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

මූලික සිතියමේ නො. ඒ. 4,452—ගම: අමුණුකුඹුර

**කැබැල්ල: 1.**

ඉඩමේ නම: පුවක්ගස්කොටුව; විස්තර: බැම්ම; අයිතිකම් කියන අය: ආර්. කේ. ඒ. ජයතිලක, අමුණුකුඹුර, වතුරුගම; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 1.0.

**කැබැල්ල: 2.**

ඉඩමේ නම: පුවක්ගස්කොටුව; විස්තර: කපරාදු කරන ලද තාප්ප සහ බැම්මක් ඇති ඉඩම; අයිතිකම් කියන අය: ආර්. කේ. ඒ. පීටර් සිංඤෝ, අමුණුකුඹුර, වතුරගම; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 7.4.

**කැබැල්ල: 3.**

ඉඩමේ නම: පුවක්ගස්කොටුව; විස්තර: බැම්ම; අයිතිකම් කියන අය: ඊ. ඇම්. අර්නෝලිස් අප්පුහාමි, අම්තිරිගල, රුවන්වැල්ල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 2.1.

**කැබැල්ල: 4.**

ඉඩමේ නම: මැඩිල්ලගහ කුඹුර; විස්තර: කපරාදු කරන ලද තාප්ප සහ බැම්ම ඇති ඉඩම; අයිතිකම් කියන අය: ඇස්. පී. කුමාරසිංහ, ඇවරිවත්ත, කටුනායක; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 28.1.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960ක් වූ ජූලි මස 22 වැනි දින පෙරවරු 10.30 ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960ක් වූ ජූනි මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලිය විල්ලකින් දැනුම්දිය යුතුයි.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

වෂී 1960ක් වූ අප්‍රියෙල් මස 22 වැනි දින
කොළඹ කච්චේරියේදීය.

---

අංකය: ආර්/කිව් 241.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 හේ අඩක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954 අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:—

මූලික සැලැස්ම: ඒ 4,444; පිහිටීම: කොළඹ දිසාවේ අඹතලෙන් පහළ (දකුණු අළුත්කුරු කෝරළේ) ගොතටුව

**කැබැල්ල අංකය: 1**

ඉඩමෙ නම: ගල්කෙටියවත්ත නොහොත් බටලත්දහේන; විස්තරය: අවුරුදු 30-40ක් වූ පොල් ගස් 90ක්ද, අවුරුදු 5-15 අඹ ගස් 10ක්ද, අවුරුදු 5-10 ක්වූ කොස් ගස් 30 ක්ද, අවුරුදු 2-10 ක්වූ කජු ගස් 12 ක්ද, අවුරුදු 2-6 පොල් පැල 65, අවුරුදු 5 ක්වූ ජම්බෝල ගසක්ද, ලාවුලු ගස් 3 ක්ද, පේර ගස් 2 ක්ද, උන සහ කෝපි පඳුරු 3 ක්ද, අවුරුදු 2-5 පුවක් ගස් 40 ක්ද, දොඩම් ගස් 4 ක්ද, දෙහි ගස් 7 ක්ද, අවුරුදු 1-5 නැඳුන් ගස් 10 ක්ද, වහලක් නොමැති මැටිවලින් තනන ලද මුළුතැන් ගෙකින් යුක් කපරාදු කරන ලද උලු හෙවිල්ලපු ගෙයක්ද, කපරාදු කරන ලද තහඩු හෙවිල්ලපු වැසිකිළියක්ද, කපරාදු කරන ලද ලිඳක්ද, මැටි වලින් තනන ලද

පොල් අතු හෙවිල් ලපු පැලක් ද වත්තේ තිබේ ; අයිතිකම් කියන අයගේ නම : ඊ. සී. ඊ. පීරිස් නෝනා මහත්මිය, 27, ග්‍රෑගරි පාර, කොළඹ 7 ; ප්‍රමාණය : අක්කර 3, රූඩ් 1, පර්චස් 26.1.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ක්වූ මැයි මස 30 වැනි දින පෙරවරු 11ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960 ක්වූ මැයි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ලුඩිකන්ස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ
අතිරේක ඒජන්තතුමා.

වෂී 1960 ක්වූ අප්‍රේල් මස 22 දින,
කොළඹ කච්චේරියේදීය.

---

අංකය : ආර්/කිච් 239.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 ශේ අඩක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1954 අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම : ඒ 4,466 ; පිහිටීම් : කොළඹ ප්‍රාදේශිය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ ගොඩිගොමුව නමැති ගමෙහි

**කැබැල්ල අංකය : 1**

ඉඩමෙ නම : පෙළෙන්ගහකුඹුර කුකුලාදෙනිය ; විස්තරය : කුඹුර ; අයිතිකම් කියන අයගේ නම : වයි. දොන් ඩේවිඩ් තොහොත් අප්පුහාමි 388, ගොඩිගොමුව, මහරගම, වයි. දොන් සැමුවල් අප්පුහාමි, 391, ගොඩිගොමුව, මහරගම, වයි. ඩී. පවුලිස් අප්පුහාමි, ඇල්. දෝනා ජීමා නෝනා, වයි. ඩී. ගේබ්‍රියල් අප්පුහාමි සියල්ලෝම 390, ගොඩිගොමුව, මහරගම, වයි. දොන් රූබන් අප්පුහාමි, 393, ගොඩිගොමුව, මහරගම සහ වයි. දෝනා මරියා හාමිනේ, පමුණුව, මහරගම; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 00.3.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960ක්වූ මැයි මස 28 වැනි දින පෙරවරු 11ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960 ක්වූ මැයි මස 18 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ලුඩිකන්ස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ
අතිරේක ඒජන්තතුමා.

වෂී 1960 ක්වූ අප්‍රේල් මස 22 දින,
කොළඹ කච්චේරියේදීය.

---

අංකය : ආර්/කිච් 133.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 ශේ අඩක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1954 අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම : ඒ 4,426 ; පිහිටීම : කොම්පොඤ්ඤවීදිය, අංක 15 දරණ කොට්ඨාශය—වැකන්ද, කොළඹ නාගරිකය සීමාවතුළ

**කැබැල්ල අංකය : 1**

ඉඩමෙ නම : චර්ච් වීදියේ වරිපනම් අංක 47 ; විස්තරය : කපරාදු කරන ලද උළු සෙවිල්ලපු ගොඩනැගිලි හූනක් සහ ගල් අල්ලපු පොලොවද ; අයිතිකම් කියන අයගේ නම : ඇම්. ඇස්. ඇම්. කමල්දීන්, 37, චර්ච් වීදිය, කොළඹ 2 ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 13.72.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ක්වූ මැයි මස 30 වැනි දින පෙරවරු 10ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960 ක්වූ මැයි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ලුඩිකන්ස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ
අතිරේක ඒජන්තතුමා.

වෂී 1960 ක්වූ අප්‍රේල් මස 22 දින,
කොළඹ කච්චේරියේදීය.

---

අංකය : ආර්/කිච් 262.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 ශේ අඩක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1954 අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම : ඒ. 4,472 ; පිහිටීම : කොළඹ නාගරිකය සීමාව තුළ අංක 32 දරණ දකුණු තිඹිරිගස්යාය කොට්ඨාශය

**කැබැල්ල අංකය : 1**

ඉඩමේ නම : මීගහවත්ත, තිඹිරිගස්යාය පාරේ වරිපනම් අංක 410. 410/2-8, 414, 414/1-12, 414/14-17, 414/18, 414/67-73 416/41-44, 416/50 සහ 416/55 ; විස්තරය : අවුරුදු 2-30ක්වූ පොල් ගස් 67 ක් සහ අඹ ගස් 6 ක් ද, අවුරුදු 2-10 ක්වූ කොස් ගස් 3 ක් ද, අවුරුදු 2-20 ක්වූ පුවක් ගස් 11 ක් ද, අවුරුදු 2 ක්වූ දෙඹම් සහ දෙහි ගස් 2 බැගින් ද, අවුරුදු 10 ක්වූ දෙල් ගසක් සහ තෙල්ලි ගසක් ද, අවුරුදු 3 ක්වූ කොහොඹ ගසක් ද, අවුරුදු 20 ක්වූ කපු ගසක් ද, අවුරුදු 5 ක්වූ බිලින් ගසක් ද, කෙසෙල් පඳුරු 30 ක් ද, උළු හෙවිල්ලපු කපරාදු කරන ලද ගොඩනැගිලි 4 ක් හා මැටිවෙහි හාරන ලද ළිඳක් ද ; අයිතිකම් කියන අයගේ නම : කදිරවේල් නාගම්මා, 95, මීගමු පාර, පෑලියගොඩ ; ප්‍රමාණය : අ. 2, රූ. 0, ප. 27.85.

ඉහත සඳහන් ඉඩමට, හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ක්වූ මැයි මස 28 වෙනි දින පෙරවරු 10ට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960 ක්වූ මැයි මස 18 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ලුඩිකන්ස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ
අතිරේක ඒජන්තතුමා.

වෂී 1960 ක්වූ අප්‍රේල් මස 22 දින,
කොළඹ කච්චේරියේ දීය.

---

අංකය : ආර්/කිච් 192.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 ශේ අඩක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1954 අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම : එස් 3,969 ; පිහිටීම : කෝට්ටේ පළාත් ආණ්ඩු සභාව සීමාව තුළ 4 වෙනි කොට්ඨාශයේ නාවල (වැලිකඩ කොටස)

**කැබැල්ල අංකය : 83**

ඉඩමෙ නම : මරදන් කුරුඳුවත්ත, නාවල පාරේ වරිපනම් අංක 600 න් කොටසක් ; විස්තරය : අවුරුදු 2-5 ක්වූ දෙහි ගස් 2 ක්ද, කෙසෙල් පඳුරු 4 ක්ද, උඩින් කම්බි අදින ලද විදුලි කණු 2 ක්ද, වත්තේ තිබෙත් ; අයිතිකම් කියන අයගේ නම : ඇල් බට් විජේසිංහ, "නිමල්" 600, නාවල පාර, රාජගිරිය, කොළඹ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 04.9.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ක්වූ මැයි මස 30 වැනි දින අපරභාග 2.30ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960 ක්වූ මැයි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ලුඩිකන්ස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ
අතිරේක ඒජන්තතුමා.

වෂී 1960 ක්වූ අප්‍රේල් මස 23 දින,
කොළඹ කච්චේරියේදීය.

---

අංකය : 3/41/57.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීම ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගුන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

පිඹුර : ගම් සිතියම් 333, උධෘත 1 ගම : නිලගම.

**බිම් කට්ටිය : 1.**

නම : වරායාය ; විස්තරය : ගොඩනැගිල්ලක් සඳහා දමා ඇති පරණ අත්තිවාරමක්ද, අවුරුදු 20 වැඩි පොල් ගස් 4 ක් ද ඇති ඉඩම ; අයිතිකම් කියන්නා : ගලේවෙල, නිලගම ; පන්සලේ, එච්. ප්‍රේමරතන ස්ථවිර ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 24.

එකතුව : අ. 0, රූ. 2, ප. 24.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ජූනි 17 වැනි දින පූ. භා. 9.30 ට මාතලේ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 ජූනි 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඇන්. ඩබ්ලිව්. එච්. ඩී. ගුණරත්න,
මාතලේ දිස්ත්‍රික්කයේ රජයට ඉඩම් අත්කර ගන්නා නිලධාරි.

1960 අප්‍රේල් මස 12 වැනි දින,
මාතලේ කච්චේරිය.

---

අංකය : 3/41/48.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

පිඹුර : අවසාන ගම්සිතියම් 87 අතිරේක අංක 1. ගම : ඇලමල්පොත.

**බිම් කට්ටිය : 39.**

නම : පරණගෙදරවත්ත ; විස්තර : හේන-තාවකාලික වැවිලි ඇත ; අයිතිකම් කියන්නෝ : ඇලමල්පොත, ඊ. ජී. නානා ජෙබර්දීන් ; ප්‍රමාණය : අ. 1, රූ. 3, ප. 35.5.

එකතුව : අ. 1, රූ. 3, ප. 35.5.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ජූනි 17 වැනි දින පූ. භා. 11 ට මාතලේ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 ජූනි 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඇන්. ඩබ්ලිව්. එච්. ඩී. ගුණරත්න,
මාතලේ දිස්ත්‍රික්කයේ රජයට ඉඩම් අත්කර ගන්නා නිලධාරි.

1960 අප්‍රේල් මස 12 වැනි දින,
මාතලේ කච්චේරිය.

---

සඳහන් කළයුතු අංකය : ඇල්ඒ/ඞී 81.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තකකිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනයවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පොදු කටයුත්ත : මාම්පිටිය-වටරැක ගම් සහා පාර දියුණු කිරීම සඳහා රජයට ඉඩම පවරා ගැනීම.

ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ගරු ඇමතිතුමා විසින් ඔහුගේ 1959.8.17 වැනි දින අංක ජේ 55 ඇල් ජී 467 දරණ ප්‍රකාශනයෙන් තීරණය කර 1959.11.6 වැනි දින අංක 11,940 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පරිදි, ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය : කඩවත් සතර ; ගම් මුලාදැනි වසම ; වටරැක නැගෙනහිර ; ගම : මාම්පිටිය සහ වටරැක නැගෙනහිර ; සැලැස්මේ අංකය : පී.පී.ඒ 1,663.

**ලොට් අංක 1.**

ඉඩමේ නම : පොල්කොරටුව ; විස්තර : වත්ත (වගාවක් නැත) ; ප්‍රමාණය ;: අ. 0, රූ. 0, ප. 02.3.

**ලොට් අංක 2.**

ඉඩමේ නම : පොල්කොරටුව ; විස්තර : වත්ත (වගාවක් නැත) ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.9.

**ලොට් අංක 3.**

ඉඩමේ නම : පතලවත්ත ; විස්තර : පොල්ගස් 4ක් ඇතුළත් පොල්වත්ත ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 08.5.

**ලොට් අංක 4.**

ඉඩමේ නාම : පතලවත්ත ; විස්තර : පොල්වත්ත (වගාවක් නැත) ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 06.4.

**ලොට් අංක 5.**

ඉඩමේ නම : පතලවත්ත සහ වැරනියකනත්ත ; විස්තර : පොල් වත්ත (වගාවක් නැත) ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 02.2.

**ලොට් අංක 6.**

ඉඩමේ නම : වැරනියකනත්ත ; විස්තර : පොල් ගසක් ඇතුළත් පොල්වත්ත ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 02.3.

**ලොට් අංක 7.**

ඉඩමේ නම : ගොරකගහවත්ත නොහොත් ගොඩහේනෙවත්ත ; විස්තර : පොල් ගස් 6ක් ඇතුළත් පොල්වත්ත ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 4.2.

**ලොට් අංක 8.**

ඉඩමේ නම: ගොරකගහවත්ත නොහොත් ගොඩහේනෙවත්ත; විස්තර: පොල්වත්ත (වගාවක් නැත); ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 3.

**ලොට් අංක 9.**

ඉඩමේ නම: ගොරකගහවත්ත නොහොත් ගොඩහේනෙවත්ත; විස්තර: පොල් ගස් 6ක් ඇතුළත් පොල්වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 05.0.

**ලොට් අංක 10.**

ඉඩමේ නම: අඹගහවත්ත; විස්තර: පොල් ගසක් ඇතුළත් පොල් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.5.

**ලොට් අංකය 11.**

ඉඩමේ නම: ගොරකගහවත්ත; විස්තර: අඹ ගසක් ඇතුළත් පොල්වත්තෙන් කොටසක්; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.4.

**ලොට් අංක 12.**

ඉඩමේ නම: ලාවලුගහවත්ත; විස්තර: පොල්වත්ත (වගාවක් නැත); ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.0.

**ලොට් අංක 13.**

ඉඩමේ නම: ලාවලුගහවත්ත; විස්තර: පොල්ගස් 2ක් සහ අඹ ගසක් ඇතුළත් පොල්වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.9.

**ලොට් අංක 14.**

ඉඩමේ නම: ලාවලුගහවත්ත; විස්තර: හිග් ගසක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.0.

**ලොට් අංක 15.**

ඉඩමේ නම: ලාවලුගහවත්ත; විස්තර: දෙල් ගසක් ඇතුළත් වත්ත; ප්‍රමාණය; අ. 0, රූ. 0, ප. 0.3.

**ලොට් අංක 16.**

ඉඩමේ නම: ලාවලුගහවත්ත; විස්තර: නාගසක්ද, දොන්ග ගසක් සහ අඹ ගසක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.4.

**ලොට් අංක 17.**

ඉඩමේ නම: ලාවලුගහවත්ත; විස්තර: වත්ත (වගාවක් නැත); ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.0.

**ලොට් අංක 18.**

ඉඩමේ නම: ලාවලුගහවත්ත; විස්තර: ගොරක ගහක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 0.3.

**ලොට් අංක 19.**

ඉඩමේ නම: මොරගහවත්ත; විස්තර: වගාවක් නැත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 0.9.

**ලොට් අංක 20.**

ඉඩමේ නම: මොරගහවත්ත; විස්තර: පොල් ගස් 2ක්ද, කොස් ගස් 2ක්ද, සූරිය ගසක් සහ පුවක් ගස් 5ක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.4.

**ලොට් අංක 21.**

ඉඩමේ නම: මොරගහවත්ත; විස්තර: වත්ත (වගාවක් නැත); ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 0.3.

**ලොට් අංක 22.**

ඉඩමේ නම: මොරගහවත්ත; විස්තර: වත්ත (වගාවක් නැත); ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 0.2.

**ලොට් අංක 23.**

ඉඩමේ නම: මොරගහවත්ත; විස්තර: පුවක් ගස් දෙකක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 0.2.

**ලොට් අංක 24.**

ඉඩමේ නම: මොරගහවත්ත; විස්තර: පොල් ගස් 2ක්ද, පුවක් ගස් 2ක්ද, දෙහි ගසක්ද, දොඹ ගසක් සහ නුග ගසක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.2.

**ලොට් අංක 25.**

ඉඩමේ නම: මොරගහවත්ත; විස්තර: වත්ත (වගාවක් නැත); ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 0.6.

**ලොට් අංක 26.**

ඉඩමේ නම: මොරගහවත්ත; විස්තර: වත්ත (වගාවක් නැත); ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 0.6.

**ලොට් අංක 27.**

ඉඩමේ නම: අමුනුහේනෙවත්ත; විස්තර: පොල් ගස් 10ක් ඇතුළත් පොල් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 03.6.

**ලොට් අංක 28.**

ඉඩමේ නම: අමුනුහේනෙවත්ත; විස්තර: වත්ත (වගාවක් නැත); ප්‍රමාණය; අ. 0, රූ. 0, ප. 0.9.

**ලොට් අංක 29.**

ඉඩමේ නම: කහටගහවත්ත; විස්තර: දොඹ ගසක්ද, ගොරක ගසක්ද, කොස් ගස් 2ක්ද, අඹ ගසක් සහ කිතුල් ගස් 3ක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 05.3.

**ලොට් අංක 30.**

ඉඩමේ නම: ලොකුගෙවත්ත; විස්තර; පොල්ගස් 2ක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 04.0.

**ලොට් අංක 31.**

ඉඩමේ නම: අමුනුහේනවත්ත; විස්තර: වත්ත (වගාවක් නැත); ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 00.5.

**ලොට් අංක 32.**

ඉඩමේ නම: ලොකුගෙවත්ත; විස්තර: පොල් ගසක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 02.0.

**ලොට් අංක 33.**

ඉඩමේ නම: ලොකුගෙවත්ත; විස්තර: පොල් වත්ත (වගාවක් නැත); ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 00.2.

**ලොට් අංක 34.**

ඉඩමේ නම: ලොකුගෙවත්ත; විස්තර: පොල් වත්ත (වගාවක් නැත); ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 00.3.

**ලොට් අංක 35.**

ඉඩමේ නම: ලොකුගෙවත්ත; විස්තර: පුවක් ගසක් සහ අඹ ගසක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 00.3.

**ලොට් අංක 36.**

ඉඩමේ නම: ලොකුගෙවත්ත; විස්තර: පොල් ගසක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 00.5.

**ලොට් අංක 37.**

ඉඩමේ නම: ලොකුගෙවත්ත; විස්තර: පොල් ගස් 4ක් සහ කෙසෙල් පඳුරු 2 ක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 02.8.

**ලොට් අංක 38.**

ඉඩමේ නම: ලොකුගෙවත්ත; විස්තර: පොල් ගසක් සහ දෙඹ ගසක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 00.2.

**ලොට් අංක 39.**

ඉඩමේ නම: ලොකුගෙ වත්ත; විස්තර: දෙල් ගසක් ඇතුළත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 02.9.

**මුළු ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 36.0.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ජූනි මස 6 වෙනි දින පස්වරු 3ට ගාළු දිසාපති කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 මැයි මස 30 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

අයිතිවාසිකම් සවිර කිරීමට අදාල වන ඔප්පු, ලියකියවිලි ආදිය විභාගය පවත්වන වේලාවේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

අංක ඒ 1,663 දරණ මූලික සැලැස්මේ පිටපත් බැලීම සඳහා ගාල්ලේ කඩවත් සතරේ, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායඕලයේ තැන්පත් කර ඇත.

ඇන්. ඕ. ජයවීර,
ගාළු දිස්ත්‍රික්කයේ ඉඩම් රජයට ගැනීමේ නිලධාරි තැන.

1960 ක් වූ අප්‍රේල් මස 23 වැනි දින,
ගාල්ලේ කච්චේරියේදීය.

### 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950ශේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954 අංක 39 දරන ඉඩම් ලබා ගැනීමේ සංශෝධිත ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950ශේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥා පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි. බීරි /තම්බිලු විල්/ ආණ්ඩුවේ දෙමළ මිශ්‍ර පාසැල සඳහා ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මූලික පැලැනේ අංක ඒ. 1341, ගම, තම්බිලුවිල් 2 වැනි කොට්ඨාස

කැබැල්ල 1

ඉඩමේ නම : සුබ්‍රමනියම් වෙට්ටියාර් වලවු; විස්තර : අවුරුදු 30-40 වයස ඇති පොල් ගස් 15ද, සහ තල් ගස් 2ද ඇති පොල් වත්ත; අයිතිවාසිකම් කියා සිටින්නෝ : තිරුකෝවිල්හි පදිංචි පී. තර්මරත්නම්; ප්‍රමාණය : අ. 1, රූ. 0, ප. 25.5.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ජූලි මස 1 වැනි දින පූ. භා. 9.30 වේලාවට අක්කරපත්තුවේ ප්‍රාදේශි ආදායම් නිලධාරිගේ කායඹිල යේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960 ජූනි මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධ යෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

අයිතිවාසිකම් ඔප්පු කිරීම පිණිස තිබෙන සියලුම ලියකියවිලි විභාග දිනදී මා ඉදිරියේ පෙන්විය යුතුයි. 2 වැනි කොට්ඨාසයේ තම්බිලුවිල් ගම් මුලාදැනි වෙත ලබාගන්ට යන ඉඩමේ පිඹුර ඇත. ඉඩමට අයිති වාසිකම් කියා සිටින්ට හෝ විභාගයට පෙනී සිටින්ට ප්‍රථමයෙන් පිඹුර කියවාබලාද තවද උවමනා නම් ඉඩම සෝදිසි කොට බැලිය යුතුය.

ඇස්. කදිර්කාමනාදන්,
මඩකලපුවේ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප දිසාපති තැන.

වර්‍ෂ 1960ක්වූ අප්‍රේල් මස 19 දින,
මඩකලපු කච්චේරියේදීය.

---

සඳහන් අංකය : 3/62/98.
ජේ. 57/58/එල් ජී 395.

### 1950 අංක 9 දරණ ඉඩම් අත්කරගැනීමේ ආඥාපණත

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කායඹියක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර :—

මූලික සැලැස්ම අංක ඒ 1,629. ගමේ නම : ගන්ගොඩ, අංක 1 දරණ කුරුණෑගල නාගරික සීමාව තුළ පිහිටි ගන්ගොඩ නැමැති කොට්ඨාශය, වැඋඩ විල්ලි හත්පත්තුව, කුරුණෑගල දිස්ත්‍රික්කය, වයඹ පළාත

කැබැල්ල : 1.

ඉඩමේ නම : අන්ගන්ගල පන්සල වත්ත, වරිපනම් අංක 220 දරණ පුත්තලම් පාරේ පිහිටි ඉඩමෙන් කොටසක් ; විස්තර : පොල්වත් තෙන් කොටසක් වගා කර නැත ; අයිතිකම් කියන්නා : කුරුණෑගල අන්ගන්ගල විහාරයේ භාරකරුවන් ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 1.13.

කැබැල්ල : 2.

ඉඩමේ නම : අන්ගන්ගල පන්සල වත්ත, වරිපනම් අංක 220 දරණ පුත්තලම් පාරේ පිහිටි ඉඩමෙන් කොටසක් ; විස්තර : අවු. 4-12 දක්වා වයසැති පොල්ගස් 4ක් ඇති පොල් ඉඩම හා සවිර සිමෙන්ති වැසිකිළියක් ඇත ; අයිතිකම් කියන්නා : කුරුණෑගල අන්ගන්ගල විහාරයේ භාරකරුවන් ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 08.95.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වලට සම්බන්ධතා වන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 ජූනි මස 27 දින පූ.භා. 9.15ට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1960.6.20 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීම කින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

එම්. එල්. ජේ. වික්‍රමරත්න,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

කුරුණෑගල කච්චේරිය,
1960 අප්‍රේල් මස 20 දින.

---

සඳහන් අංකය : 3/62/99.
ජේ 57/58 එල් ජී 395.

### 1950 අංක 9 දරණ ඉඩම් අත්කරගැනීමේ ආඥාපණත

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කායඹියක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර :—

මූලික සැලැස්ම අංක ඒ 1,628. ගමේ නම : ගන්ගොඩ, අංක 1 දරණ කුරුණෑගල නාරික සීමාව තුළ පිහිටි ගන්ගොඩ නැමැති කොට්ඨාශය, වැඋඩ විල්ලි හත්පත්තුව, කුරුණෑගල දිස්ත්‍රික්කය, වයඹ පළාත

කැබැල්ල : 1.

ඉඩමේ නම : අන්ගන්ගල පන්සල වත්ත, වරිපනම් අංක 235/1 දරණ පුත්තලම් පාරේ පිහිටි ඉඩමෙන් කොටසක් ; විස්තර : පොල් වත්ත, වගාකර නැත ; අයිතිකම් කියන්නා : කුරුණෑගල අන්ගන්ගල විහාරයේ භාරකරුවන් ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 0.68.

කැබැල්ල : 2.

ඉඩමේ නම : අන්ගන්ගල පන්සල වත්ත, වරිපනම් අංක 235/1 දරණ පුත්තලම් පාරේ පිහිටි ඉඩමෙන් කොටසක් ; විස්තර : පොල් වත්ත, වගාකර නැත, සවිර සිමෙන්ති වැසිකිළියක් ඇත ; අයිති කරුගේ නම : කුරුණෑගල අංගන්ගල විහාරයේ භාරකරුවන් ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 07.99.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වලට සම්බන්ධතා වන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලයලත් නියෝජිතයන් 1960 ජූනි මස 27 දින පූ.භා. 9.30ට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1960.6.20 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීම කින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

එම්. එල්. ජේ. වික්‍රමරත්න,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

කුරුණෑගල කච්චේරිය,
1960 අප්‍රේල් මස 20 දින.

---

සඳහන් අංකය : 3/63/29
ජේ 57/58 ඊ 405.

### 1950ශේ අංක 9 දරණ ඉඩම් අත්කරගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කායඹියක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර :—

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ තිස්සව කෝරළේ රත්මල්ල ගමේ අවසාන ගම් මැනීමේ අංක 2314රේ 1 වෙනි අතිරේකය.

කැබැල්ල : 133.

ඉඩමේ නම : කදුරුගහමුලවත්ත, මීගහමුලවත්ත, අඹගහමුලවත්ත, බෝගහමුලවත්ත, කොහොඹගහමුලවත්ත, එපිටමුලවත්ත ; විස්තරය : අවු. 50 වැඩි පොල් ගස් 18, අවු. 20-25 පොල්ගස් 36, අවු. 4-10 පොල්ගස් 11, අවු. 10-15 පුවක්ගස් 10, අවු. 20-75 කොස්ගස් 5, අවු. 20-40 කොහොඹගස් 2, අවු. 10-15 ගොරකගස් 1, අවු. 1-10 හල්මිල්ල ගස් 7, අවු. 30-50 බිලිංගස් 1, අවු. 10-15 අඹගස් 2, අවු. 5-10 කිතුල්ගස් 1, අවු. 5-10 මීගස් 1, අවු. 5-15 පුළුන්ගස් 5 සහ ඇස්බැස්ටස් සෙවිලිකළ කොටසක් සිමෙන්ති බදිනලද ගොඩ නැගිල්ලක් සහිත ඉඩම ; අයිතිකම් කියන්නෝ : ඇන්. ජී. ජයතිලක,

5 වැනි වගන්තිය යටතේ ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමාගේ 58.9.22 දින දරණ ප්‍රකාශයෙහි 1, 6 සහ 7 වැනි ඡේද යන්හි පහත සඳහන් සංශෝධනයන් කරනු.

(1) 1 වැනි ඡේදයෙහි, දෙවෙනි පේළියෙහි "33" යන ඉලක්කම් අස්කර ඒ වෙනුවට ඉලක්කම් "33/1ඒ" යොදනු.

(2) 6 වැනි ඡේදයෙහි, දෙවෙනි පේළියෙහි "19" යන ඉලක්කම් අස්කර ඒ වෙනුවට ඉලක්කම් "33/6" යොදනු.

(3) 7 වැනි ඡේදයෙහි, දෙවෙනි පේළියෙහි "වරිපනම් අංක 21" යන වචන අස්කර ඒ වෙනුවට "වරිපනම් අංක 17 සහ 21" කියා යොදනු.

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## මඩකලපු දිස්ත්‍රික්කයේ වෙඩ්ඩකාඩුවේ—පදිංචිය සඳහා ඤානසූරියම් චතුරශ්‍රයේ පිටුපසින් පිහිටි රජයේ ඉඩම් කැබලි 12ක් බදු දීමට වෙන්දේසියයි

මඩකලපු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ පාලන දිසාපතිතුමා (මින්පසු ආණ්ඩුවේ දිසාපතිතුමා යනුවෙන් ව්‍යවහාරවේ) විසින් 1960 මැයි මස 30 වැනි දින පෙරවරු 9.30 වේලාවට මඩකලපු කච්චේරියේ දී මඩකලපු දිස්ත්‍රික්කයෙහි පිහිටි ආණ්ඩුවේ ඉඩම් කැබලි 12 ක් බදු දීම සඳහා වෙන්දේසියක් පවත්වනවා ඇත. පදිංචිය සඳහා බෙදා දීමට යන ඉඩම් කැබැල්ලක ප්‍රමාණය අක්කර 1/3 ක් වේ. මීට යාව තිබෙන උපලේඛනයේ මේ ඉඩම් වල විස්තර දක්වා ඇත.

2. ඉල්ලීමේදී ලන්සුවේ ගණන වාර්ෂික කුලිය අනුව වේ. පර්චස් එකකට රුපියලට වඩා අඩු නම් එය වෙන්දේසියේදී බාර ගනු නොලැබේ.

3. ආණ්ඩුවේ දිසාපතිතුමාගෙන් වෙන්දේසියේදී ලන්සුව තබා ඉල්ලීමට ප්‍රථමයෙන් ලියවිල්ලකින් අවසර පත්‍රයක් ලත් කෙනෙකුට පමණක් වෙන්දේසියේදී ඉල්ලීමට ඉඩදෙනවා ඇත. එවැනි අවසර පත්‍රයක් ලබාගැනීමට 1960 මැයි මස 14 වැනි දිනට හෝ ඊට මත්තෙන් ආණ්ඩුවේ දිසාපතිතුමා වෙත ලැබෙන ලෙස ඉල්ලුම් පතක් එවිය යුතුය. ඒත්තු ගැනීමට හැකි අන්දමට යට සඳහන් කොන්දේසි සියල්ලක්ම සම්පූර්ණ නැති නම් එවැනි අවසර පත්‍රයක් දෙනු නොලැබේ :—

අ. ඉල්ලුම්කරුන්ට හෝ ඔහුගේ නමින් හෝ ඇගේ නමින්ද, පුරුෂයාගේ නමින් හෝ භායඹාවගේ නමින් හෝ තමාගෙන් යැපෙන ළමයින්ගේ නමින්ද පදිංචියට ගෙයක් නොමැති කෙනෙක් වියයුතුය.

ආ. ඉල්ලුම්කරුට හෝ ඔහුගේ පුරුෂයාට හෝ භායඹාවට මඩකලපු දිස්ත්‍රික්කයේ හෝ මඩකලපු නගරයේ ඉල්ලුම් කරන දිනට පෙර නොකඩවා අවුරුදු 10 ක කාලයක් පදිංචිව සිටිය යුතුය.

ඉ. මඩකලපු නගර සහා මායිම තුල ඉල්ලුම්කරුට හෝ ඔහුගේ පුරුෂයාට හෝ භායඹාවට හෝ ඔහුගෙන් යැපෙන ළමයින් වද ගේකට සුදුසු අක්කර 1/2 කට වැඩියෙන් බෙදා වෙන් කළ හෝ බෙදා වෙන් නොකළ ඉඩමක් අයිතිකරුවෙකු නොවිය යුතුයි. මේ ඡේදයේ අනුව බෙදා වෙන් කළ කැබිලි හෝ බෙදා වෙන් නොකළ පංගුවේ ඉඩම් අක්කර 1/4 කට වැඩි ඉඩම් ප්‍රමාණයක් පමණක් කල්පනාවට ගනු ලැබේ.

ඊ. ආණ්ඩුවේ දිසාපතිතුමා වෙත රුපියල් 25 ක් තැන්පත් කළ යුතුයි.

4. යම් අන්දමකින් ඉල්ලන ලන්සුවේ ගණන හෝ ගැනුමට යෝජනා ගණන, බද්දේ අඩුම වෙන්දේසි මිලට වඩා දෙගුණයක් වැඩි වුවහොත් රජයේ විසින් අයිතිකම තබා ගන්නවා ඇත.

අ. ගෙවිය යුතු අඩුම බද්ද මුදලක් නියම කිරීම සඳහා කල්පනාවට ගනු ලැබේ.

ආ. නියම කරන ලද බදු මුදල සමග ඉල්ලන ලද ලන්සුවේ ගණන හෝ ගැනුමට යෝජනා ගණන වල වෙනස ගණනින් 20 පංගුවක මුදලක් වාර මුදල වශයෙන් බදුකරුට ගෙවන්ට නියම කිරීමද.

5. ඔහුගේ ලන්සුවේ මුදල් ගණන පිළිගත් වහාම ලන්සුකරු විසින් ඔහුගේ ලන්සුවේ මුදල හෝ 4 වැනි ඡේදයේ නියමිත යම් ගණනක් ඇති නම් එම මුදල ආණ්ඩුවේ දිසාපතිතුමාට ගෙවිය යුතුයි.

6. ආණ්ඩුවේ දිසාපතිතුමා නියම කළොත් සඵලවූ ලන්සුකරු විසින් දින 10 ක කාලය තුල බදු ඔප්පුවකට ඇතුලත් විය යුතුයි. යම් අන්දමකින් සඵලවූ ලන්සුකරු විසින් එකී ඔප්පුවට ඇතුලත් නුවහොත් හෝ ඔහුගේ ලන්සුව බාරගත් කොන්දේසිය කඩ කළොත්, ආණ්ඩුවේ දිසාපතිතුමා විසින් එම විකිණීම අවලංගු කොට ලන්සුකරු විසින් තැන්පත් කරනලද මුදල රාජසන්තක කරනවා ඇත.

7. තව වෙනත් කොන්දේසි හැර යටකී කොන්දේසි එක් එක් බද්දට ඇතුලත් වේ.

අ. වාරය—අවුරුදු 99 යි.

ආ. බද්ද—පලමු අවුරුදු 3 කාලය තුල, ලන්සු බද්ද ගණනින් හෝ 4 වැනි ඡේදයේ සඳහන්වූ කොන්දේසි වල මුදලෙන් තුනෙන් කොටසක් වාර්ෂික මුදලක් වශයෙන් ගෙවිය යුතුයි. අවුරුදු 30 කට වරක් බදු මුදල් ප්‍රතිශෝධනයට කරුණක් විය හැක. වුවොත් එම ප්‍රතිශෝධනයදී ප්‍රතිශෝධනයට ප්‍රථමයෙන් ගෙවන ලද බදු මුදලෙන් සියයට පනහකට වඩා වැඩියෙන් බදු මුදල වැඩි නොකරන බවද.

ඉ. ආණ්ඩුවේ දිසාපතිතුමාගෙන් ප්‍රථමයෙන් ලබාගත් ලියවිල්ලකින් අනුමත කරන ලද සැලැස්මක්ද හා විශේෂ විස්තර සහ නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධි විධාන අනුව බදුකරු විසින් තමාගේ වියදමින් බදු දීනේ සිට අවුරුදු 3 ක කාලයක් තුල අඩු ගණනේ රුපියල් 10,000 ක වටිනාකම ඇති ගොඩනැගිල්ලක් බැඳවිය යුතුයි.

ඊ. බදුකරු විසින් නිවාසයක් හැර ඉඩම වෙන දේකට පාවිච්චි නොකළ යුතුයි.

උ. ඉඩම් කොමසාරිස්තුමාගෙන් ප්‍රථමයෙන් අනුමතයක් ලබා නොගෙන බදුකරු විසින් තමාගේ ඉඩමට ඇති සම්බන්ධකම අන් කෙනෙකුට අතුරු බද්දක් දීමට හෝ පරිත්‍යාග කිරීමට හෝ උකස් කිරීමට හෝ වෙනත් අන්දමින් ගණුදෙනුවක් නොකළ යුතුයි.

ඌ. බදු කාලය අවසන්වූවිට හෝ ඊට ප්‍රථමයෙන් බදු අවසන් කළොත් බදුකරු විසින් ඉඩම සහ එහි තිබෙන ගොඩනැගිලි ද, සංවර්ධන වැඩද, සවිකරනලද දේද සමාදානයෙන් ආණ්ඩුවේ දිසාපතිතුමාට බාර දිය යුතුයි. සාධාරන අන්දමට කැඩුම් බිඳුම් වලට නියම දීමනාව සලකනවා ඇත.

එ. ආණ්ඩුවේ දිසාපතිතුමාගේ සෑහීමට ඉඩම හා ගොඩනැගිල්ල පිරිසිදුවටත් හොඳ අලුත්වැඩියා ලෙසටත් බදුකරු විසින් තැබිය යුතුයි.

ඒ. ඉඩමේ තිබෙන ගොඩනැගිල්ලට හෝ වෙනත් සංවර්ධන වැඩ වලට හෝ වෙනත් යම් කිසි කරුණු සඳහා රජයෙන් වන්දි ගෙවන්නේ නැත.

8. බද්ද ගැන තවදුරට විස්තර දැනගන්ට උවමනා නම් ආණ්ඩුවේ දිසාපතිතුමා ගෙන් ඉල්ලුම් කරන්න.

9. 3 වැනි ඡේදයේ "ඊ" වගන්තියේ නියමිත මුදල තැන්පත් කළාට පසු, මෙම කච්චේරියේ ඉඩම් පිළිබඳ අංශයෙන් ඉල්ලුම් පතේ ආකෘති පත්‍රයක් ලබා ගත හැක.

බී. ආර්. දේවරාජන්,
මඩකලපු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ වැඩබලන
දිසාපතිතැන.

1960 අප්‍රේල් මස 20 වැනි දින,
මඩකලපුවේ දීය.

### උපලේඛනය

මඩකලපු දිස්ත්‍රික්කයේ, මන්මුන උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ කොට්ඨාසයේ, තාන්ඩවන්වලි ගම් මුලාදෑනිගේ කොට්ඨාශයට අයත් වෙඩ්ඩකාඩු ගමෙහි පිහිටි ආණ්ඩුවේ නගර නිර්මාණකගේ අංක 2443/5 6 දරණ සැලැස්මේ පෙනෙන ප්‍රමාණයෙන් අක්කර 1/3 ක් පමණ බැගින් ඇති ආණ්ඩුවේ ඉඩම් කැබැලි 12 ක් වේ.

---

මෙහි පහත දැක්වෙන අංක 1 දරණ උපලේඛනයේ විස්තර කොට ඇති බණ්ඩාරවෙල නගරයට නුදුරින් පිහිටි රජයේ ඉඩම් ගොඩනැගිලි සෑදීමට බෙදාදීම සඳහා බදුලු දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ මහ පළාත සහ යටිකිඳ ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයට අයත් කුඹල්වෙල ගම්මුලාදෑනි තැනගේ කොට්ඨාශය යන දෙකොට්ඨාශයන්හි පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් භාරගනු ලැබේ.

2. සෑම ඉල්ලුම් පතක්ම මෙහි පහත දැක්වෙන අංක 2 දරණ උපලේඛනයේ පරිදි පිළියෙල කොට බදුලු දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙත 1960 ජූලි මස 6 වැනි දින හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

3. අයැදුම් පත් භාරගනු ලබන්නේ මෙහි පහත දැක්වෙන ආදායම් ලබන්නවුන්ගෙන් පමණි.—

(1) රු. 2,000 සිට රු. 12,000ක වාර්ෂික ආදායමක් ඇති අවිවාහකයන්ගෙන්, සහ

(2) රු. 2,000 සිට රු. 24,000ක වාර්ෂික ආදායමක් ඇති විවාහකයන්ගෙන්ය.

4. බෙදාදෙනු ලබන බිම් කට්ටි අක්කර $\frac{1}{4}$ ටත් අක්කර $\frac{1}{2}$ටත් අතර ප්‍රමාණයන් වනු ඇත.

5. තෝරාගන්නා ලද අයැදුම්කරුවනට පහත සඳහන් ක්‍රමයන් ගෙන් එක් ක්‍රමයක් යටතේ ඉඩම් බෙදාදෙනු ලැබේ :—

(අ) 1947 අංක 8 දරණ රජයේ ඉඩම් පිළිබඳ ආඥාපනත යටතේ 99 අවුරුදු බද්දක් වශයෙන්. මෙම ක්‍රමය යටතේ දෙනු ලබන ඉඩම් පිළිබඳ කොන්දේසි මෙම දැන්වීමෙහි අංක 6 දරණ ඡේදයෙහි දැක්වේ.

(ආ) ජාතික නිවාස පිළිබඳ කොමසාරිස්තුමා විසින් ගෙවල් ගොඩ නඟා ඒවා කුලියට දීමට කැමතිවූ අවස්ථාවලදී ඉඩම ජාතික නිවාස පිළිබඳ කොමසාරිස්ට රජය විසින් භාර දෙනු ලැබේ. එවිට එතුමා ගෙවල් ගොඩනඟා 1954රේ අංක 37 දරණ ජාතික නිවාස පනත යටතේ එම ගෙවල් තෝරාගන්නා ලද අයැදුම්කරුවනට කුලියට දෙනු ලැබේ. මෙම ක්‍රමය යටතේ එම ගෙවල්වල වටිනාකම ගෙවූනාට පසු තමන් හට අයිති වනු ඇත.

(ඉ) ජාතික නිවාස පිළිබඳ කොමසාරිස්තුමා ගෙවල් සාදා ගැනීම සඳහා ණය මුදල් දීමට කැමති වූ විට ඉඩම් කැබෙලි එතුමා වෙත භාරදෙනු ලැබේ. එවිට ඊට නියමිත වටිනාකම ගෙවූ පසු ජාතික නිවාස පිළිබඳ කොමසාරිස්තුමා එම ඉඩම් කට්ටි තෝරාගත් අයට දෙනු ලැබේ. ඉන්පසු නිවාස කොමසාරිස් තුමා ගෙන් ලබා ගන්නා ලද ණය මුදල්වලින් ගෙවල් තැනිය යුතුය.

අයැදුම්කරුවන් තම තමන්ගේ අයැදුම් පත්‍රයන්හි ඉඩම් අයැදුම් කරන්නේ ඉහත සඳහන් ක්‍රමයන්ගෙන් කිනම් ක්‍රමය යටතේ දැයි සඳහන් කළ යුතුය. මෙම ක්‍රමයන්ගෙන් (අ) සහ (ආ) යටතේ ලබාගන්න ලද ඉඩම් යම් කාලයකින් පසු තමා සතු වන බව වටහා ගත යුතුය.

6. 1947තේ අංක 8 දරණ රජයේ ඉඩම් පිළිබඳ ආඥාපනත යටතේ දෙනු ලබන ඉඩම් කට්ටි බෙදාදෙනු ලබන්නේ පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව ය :—

(අ) එක් ඉඩම් කට්ටියක් සඳහා ගෙවිය යුතු බදු මුදල වර්ෂයකට රුපියල් 100කි. මෙම බදු මුදල වර්ෂ 30කට වරක් සංශෝධනය කරනු ලැබේ. එසේ වුවද එම බදු මුදල වැඩි කරනු ලබන්නේ කළින් පැවති බදු මුදලෙන් සියයට 50කට නොවැඩි වන සේ ය.

(ආ) පළමුවන 30 අවුරුදු බදු කාලය ඇතුළත පළමුවන වර්ෂ තුන සඳහා ගෙවිය යුත්තේ වාර්ෂික බදු මුදලෙන් 1/3 බැගින් ය.

(ඉ) බදුලු දිසාවේ දිසාපතිතුමන් මගින් ඉඩම් කොමසාරිස්තුමන් ගේ අනුමැතිය ලියවිල්ලකින් නොලැබ මෙම ඉඩමේ බද්ද විකිණීම, උගස් තැබීම, පැවරීම, කොටස් වශයෙන් බදු දීම හෝ ඉඩමේ අයිතිය වෙනස්වන මොනම විධියේ දෙයක් හෝ කිරීම නීති විරෝධි වන්නේ ය.

(ඊ) බදුකරු තමන් විසින් ඉඩමේ ඉදිකරන ලද ගොඩනැගිලි ආදිය, බදුලු දිසාවේ දිසාපතිතුමන් ගේ සතුටට හේතුවන පරිදි නඩත්තු කිරීමට හා අළුත්වැඩියා කිරීමට බැඳී සිටී.

(උ) බදුකරු විසින් බදුලු දිසාවේ දිසාපතිතුමන්ගේ අනුමැතිය ලැබූ සැලැස්මක් අනුව රු. 5,000 වටිනා ගෙයක් ගොඩනැගිය යුතුය. මෙම ගොඩනැගිල්ලෙහි වැඩ අවසන් කළ යුත්තේ බදුකරු විසින් තම අයැදුම් පතෙහි සඳහන් කළ කාලය ඇතුළත හෝ දිසාපතිතුමන් විසින් නියම කරනු ලබන කාල සීමාවක් ඇතුළතදී ය.

(ඌ) බදුකරු ඉඩම වටා වැටක් හෝ තාප්පයක් ඉදිකොට බද්ද වලංගුව පවත්නා කාලය තුළ ඒ වැට හෝ තාප්පය දිසාපති තුමන්ගේ සතුට පරිදි අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම කළ යුතුය.

(එ) තවද මෙම බදු කාලය තුළ බදුකරු ඉඩම වටා සිටුවා ඇති රජයේ මායිම් ගල් රැක බලා ගැනීමටත් ඔහුගේ වියදමින් ඒවා අළුත්වැඩියා කිරීමටත් බැඳී සිටී.

(ඒ) ඉඩමත්, ගෙයත් වෙනුවෙන් ගෙවිය යුතු අය බදු ආදී මොනම ගෙවීම් ක්‍රමයක් වුවත් බදුකරු විසින් ගෙවිය යුතුය.

(ඓ) බදු කාලසීමාව ගෙවුනු පසු හෝ රජයේ තීරණයක් අනුව ඊට පෙර හෝ බදුලු දිසාවේ දිසාපතිතුමන්ට හෝ එතුමන් ගේ අණලත් නිලධාරිතුමෙකුට හෝ ඉඩම භාරදීමට බදුකරු බැඳී සිටී. එසේ භාර දෙන විට ඉඩමේ ගොඩනැගිලි හා වෙනත් සෑම දෙයක්ම යථා තත්ත්වයෙන් අළුත්වැඩියා කොට භාර දිය යුතුයි. මෙවැනි ඉදි කිරීම්, ගොඩනැගිලි, අළුත් වැඩියා කිරීම් වැනි මොනම දෙයකට හෝ බදුකරුට අලාභයක් හෝ වන්දියක් ඉල්ලීමේ අයිතියක් නැත.

7. බදු දීම පිළිබඳ තවත් විස්තර අවශ්‍ය නම් බදුලු දිසාවේ දිසාපති තුමන් ගෙන් ඒගැන විමසා දැනගත යුතුයි.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
බදුලු දිස්ත්‍රික්කයේ දිසාපති තුමා.

කච්චේරිය, බදුල්ල,
24 මාර්තු, 1960

### උපලේඛණය අංක 1

බෙදාදීමට අදහස් කොට ඇති ඉඩම්වල විස්තර :

පළාත : ඌව ; දිසාව : බදුල්ල ; කොට්ඨාශය : හපුතලේ ; කෝරළය : මහපළාත ; ගම : මැටිපිම්බිය.

ප්ලෑන : අවසාන ගම් සැලැස්ම අංක 116—බිපිබීඇස්.,

බිම් කට්ටි : 6, 7, 8, 9, 65, 67, 66, 82, 63, 62, 64, 78. 81. 79. 59, 84, 83, 60, 85, 86, 87, 88, 89, 90, 106, 109, 108, 107, 118, 128, 151, 135, 132, 158, 148, 147, 153, 154, 42, 140, 110 111 113, 138, 137, 120, 117, 15, 52, 17.

2. අවසාන ගම් සැලැස්ම අංක 19—බිපිබීඇස්—කිණිගම.

බිම් කට්ටි : 130, 131, 132, 133, 134, 135, 121, 122, 119, 156, 153, 150, 144, 147, 41, 73, 72, 43, 45, 70, 68, 51, 49, 145, 157, 158, 40, 32, 31, 30, 69, 47, 62, 39.

3. බණ්ඩාරවෙල නගර නිර්මාණ ප්ලෑන.
බිම් කට්ටි : 2—අක්කර ¼යි.

### උපලේඛණය අංක 2

ඉල්ලුම් පත්‍රය :

**ඌව පළාතේ බණ්ඩාරවෙල නගරය පුළුල් කිරීමේ ව්‍යාපාරයෙන් මධ්‍යම පංති ක්‍රමය යටතේ ඉඩමක් ඉල්ලීමේ අයැදුම් පත්‍රයයි**

(1) අයදුම්කරුගේ නම සහ ලිපිනය :———.

(2) ස්ථිර පදිංචිය :———.

(3) රක්ෂාව :———.

(4) විවාහකද ? අවිවාහකද ? යන වග සහ යැපෙන්නන්ගේ ගණන :———.

(5) ලාංකිකයෙක් ද යන වග :———.

(6) ආදායම් බදු දෙපාර්තමේන්තුවේ අවසාන තක්සේරුව අනුව වාර්ෂික ආදායම :———.

(7) තමා සතු පෞද්ගලික ඉඩම් ප්‍රමාණය සහ ඒවා යොදවා ඇති ක්‍රම :———.
ගොඩ ඉඩම් : අ. රූ. ප. :———.
මඩ ඉඩම් : අ. රූ. ප. :———.

(8) ඉල්ලුම් කරනු ලබන්නේ දැන්වීමේ සඳහන් කුමන වගන්තිය යටතේ ද යන වග,
5 අ.
5. ආ.
5 ඉ. යන මේවායින් කොයිකද ?

(9) රජයෙන් බදු පිට හෝ ඉඩම් සශ්‍රීක කිරීමේ ආඥාපනත යටතේ ලබා ඇති ඉඩම් සහ ඒවා යොදවා ඇති ක්‍රම :
ගොඩ ඉඩම් : අ. රූ. ප. :———.
මඩ ඉඩම් : අ. රූ. ප. :———.

(10) තමා සතුව දැනට පවත්නා මුදල් ප්‍රමාණය, තිබේ නම්, තැන්පත් කර ඇති ස්ථානය :———.

(11) ගෙයක් ගොඩනැගීම සඳහා ඔබ මුදල් සොයාගන්නේ කෙසේ දැයි සියළු විස්තර දැක්විය යුතුය. ණය මුදලක් ලබාගෙන නම් සම්පූර්ණ විස්තර පෙන්වන්න. තවද ඉඩමක් උකස් කිරීමෙන් නම් ඉඩමෙහි විස්තර සහ එහි දැන් පවත්නා වටිනාකම දිය යුතුයි :———.

(12) කිනම් කාලයක් ඇතුළත ගොඩනැගිල්ලෙහි වැඩ අවසන් කළ හැකිද ? එහි වටිනාකම :———.

(13) බණ්ඩාරවෙල හෝ ඒ අවට අයැදුම්කරුට ඇති සම්බන්ධකම් මොනවාද ? :———.

දිනය :———.
පදිංචිය :———.

———,
අයදුම්කරුගේ අත්සන.

## විශෙෂ නිවේදනයයි

1960 මැයි 10 වැනි අඟහරුවාදා සහ 11 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1960 මැයි 13 වැනිදා නිකුත් කරන 'ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 මැයි 6 වැනි සිකුරාදා පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 අප්‍රේල් 9 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.